# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/5 – 2019 සැප්තැම්බර් 23 වැනි සඳුදා – 2019.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෙලපල්ල පත්තුව සුළු කොට්ඨාසයේ, මාරන්තොටගොඩ (අ.ග.පි. 203) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක R/OPN/2013/222 හා 2014.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් දක්වෙන ඉඩම් කොටස්වලට මායිම්.

01. **කැබලි අක්ෂර 'A' – මාදොලවත්ත – ප්‍රමාණය හෙක්. 0.0204**
උතුරට: එස්. පී. පතිරණ හිමිකම් කියන මාදොලවත්ත ඉතිරි කොටස; නැගෙනහිරට: මාර්ග (ප්‍රාස) සහ අඩි පාර; දකුණට: අඩි පාර; බටහිරට: ටී. සිරිමතී ද සිල්වා හිමිකම් කියන මිල්ගස්තැන්නහේන සහ එස්. පී. පතිරණ හිමිකම් කියන මාදොලවත්ත ඉතිරි කොටස.

02. **කැබලි අක්ෂර 'B' – මාදොලවත්ත – ප්‍රමාණය හෙක්. 0.0205**
උතුරට: අඩි පාර සහ මාර්ග (ප්‍රාස); නැගෙනහිරට සහ දකුණට: එස්. පී. පතිරණ හිමිකම් කියන මාදෙලවත්ත ඉතිරි කොටස; බටහිරට: ටී. සිරිමතී ද සිල්වා හිමිකම් කියන මිල්ගස්තැන්නහේන ඉතිරි කොටස සහ අඩි පාර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2012/PC/358.
2019 ජූලි මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 -228


1A – G 31042 – 16 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*